**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැගෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.**

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



# තමිළිනීගේ කතාව

# කීරන්ගේ බල ඇණියට කොලරාවෙන් ප්‍රහාරයක්



කිසි දා අමතක නොවන අත්දැකීමකට මම දිනක් මල්ලාවි ප්‍රදේශයේ දී මුහුණ දුන්නෙමි. පිරිස් බඳවාගැනීමේ සටන්කාමීන්ගේ අදහස්වලට වශී වී සංවිධානයට එක්වූ උසස් පෙළ අධ්‍යාපනය ලබමින් සිටි ශිෂ්‍යාවක් පුහුණුව සඳහා යොමුකර තිබුණාය. දිනක් ඇයගේ පියා අපේ කඳවුරට පැමිණියේය. ඔහු වෙනත් මවුපියන් මෙන් සටන්කාමීන්ට බැණ වැදීමක් හෝ තම දියණිය ඉල්ලා අඬා වැළපීමක් හෝ කළේ නැත. දෙපා අක්‍රිය ඔහු පැමිණ සිටියේ රෝද පුටුවක උපකාරයෙනි. ව්‍යාපාරය වෙනුවෙන් ඔහු සමඟ කථා කළ යුතු වන්නේ මාය.

''නංගියේ මං අන්ත දුප්පත් හිඟන්නෙක්. හම්බවෙන කුලියක් මලියක් කරලා ලැබෙන තුට්ටු දෙක එකතු කරලා තමයි මගේ කෙල්ලට ඉගැන්නුවේ. දුව අරගලයට එකතු වුණ එක ගැන මගේ දුකක් නෑ. ගමේ රටේ සිද්ධ වෙන දේ නේ ඒක. ඒ වුණත් දුවේ, පිටරටවල්වල ඉගෙන ගන්න අය හෙට දොස්තරලා, ඉංජිනියර්ලා වෙලා මෙහෙට එනකොට රට වෙනුවෙන් සටන් කරපු මගේ දුවයි, අපේ පවුලයි ඒ අය ඉස්සරහා ඉගෙන ගත්තේ නැති හිඟන්නෝ හැටියටනේ ඉන්න වෙන්නේ. ඒ ගැන හිතනකොට තමයි මට දුක.'' යැයි පැවසුවේය. පියාට මම කොයිතරම් සැනසිලි බස් පැවසුවත් මගේ සිත තුළ ඔහුගේ ප්‍රශ්න පිළිතුරු නොමැති ප්‍රශ්න ලෙසින් තැන්පත්ව ඇත. එයට පසුව එම පියා හෝ එම දියණිය හෝ කිසිම දිනෙක මුණගැසුණේ නැත. එහෙත් කඳුළු සමඟින් පිටවූ එම වදන්වල සිරව තිබූ සත්‍යය මගේ හදවත පාරන්නට විය.

කොල්ලර් පුලියංකුලමෙහි වූ අපේ කඳවුර පුදුකුඩියිරුප්පු වෙත ගෙන ගියේය. සංවිධානයෙහි සියලුම ව්‍යුහයන් පුදුකුඩියිරුප්පුව කේන්ද්‍ර කරගෙන ස්ථාපිත කළේය. ලංකා හමුදාව කිසිසේත්ම පුදුකුඩියිරුප්පුවට ළඟා නොවෙයි යන අහේතුක විශ්වාසය ප්‍රභාකරන් නායකතුමා ඇතුළු සියලු සටන්කාමීන් තුළ විය. සංවිධානයෙහි අධි ආරක්ෂක කලාපය ලෙසින් පුදුකුඩියිරුප්පු ප්‍රදේශය සංවිධානය විසින් දැඩි ආරක්ෂක විධි විධාන යටතේ ආරක්ෂා කරන ලද්දේ ය. (නිදහස් කුරුල්ලෝ) පුවත්පත ප්‍රකාශනය කිරීමේ වගකීම නායකතුමා විසින් මා වෙත පවරන ලදි.

මෙයට පෙර අවස්ථා කීපයකදීම සංවිධානයේ නායකතුමාව හමුවීමේ අවස්ථාව ලැබී තිබුණාත් මා වෙත පවරන ලද වගකීම් හේතුවෙන් නායකතුමා මා සමඟ කෙළින්ම කතා කළ අවස්ථාව වූයේ 'සුදන්දිර පරවෛහල්' පුවත්පත වෙනුවෙන් ලැබුණු අවස්ථාවයි. පුවත්පතේ බොහෝ වෙනස්කම් සිදුකළ යුතුය යන අදහස ඔහු ඉදිරිපත් කළේය.

''කාන්තාවන්ගේ ප්‍රශ්න කාන්තාවන් තමයි හෙළිදරව් කරන්න ඕනෑ. කාන්තාවන්ට වඩා පිරිමි තමයි කාන්තා විමුක්තිය ගැන කතා කරන්නේ. මම පවා ඔයාට වැඩිය හොඳට කාන්තාවාදය ගැන කතා කරන්න දන්නවා. නමුත් ඔයාලගෙ ප්‍රශ්න සම්පූර්ණයෙන්ම තේරුම් කර ගැනීමේ හැකියාවක් මට නෑ. කාන්තාවන්ගේ සියලුම ප්‍රශ්න හරියට තේරුම් ගැනීමේ හැකියාවක් කිසිම පිරිමියෙකුට නෑ. කාන්තාවන්ගේ ප්‍රශ්න කාන්තාවෝ තමයි කතා කරන්ඩ ඕනෑ. ලියන්න ඕනෑ. එතකොට තමයි ඒක සත්‍යයක් වෙන්නේ. ඒ නිසා ''සුදන්දිර පරවෛහල්'' පුවත්පතට කාන්තාවෝ වැඩිපුර ලියන්න ඕනෑ. ලිවීමේ හැකියාව තියන සටන්කාමී සහෝදරියන්ව හඳුනාගෙන ඒ අයට ලේඛන පුහුණුවීම්, සාකච්ඡා සම්මන්ත්‍රණ හෙම තියන්ඩ ඕනෑ.'' යැයි නායකතුමා පැවසුවේය.

'මාලතී පදිප්පකම්' නම් වූ මුද්‍රණාලය පැවතියේ දේශපාලන අංශයෙහි වගකීම යටතේය. 'විඩුදලෛප් පුලිකල්' (විමුක්ති කොටි) පුවත්පත මුද්‍රණය කළේ එම මුද්‍රණාලයේය. පරිගණක ඕෆ්සෙට් ප්‍රින්ටින් යන්ත්‍ර හෝ වන්නියේ නොමැති කාලයක අකුරු අමුණා සහ බ්ලොක් මාර්ගයෙන් ඡායාරූප සකස් කර පුවත්පත මුද්‍රණය කිරීම මහත් දුෂ්කර කාර්යයක් විය. පුවත්පත මුද්‍රණය කරන නිව්ස් ප්‍රින්ට් කඩදාසි තහනම් කර තිබූ හෙයින් අවශ්‍ය කඩදාසි අපි දේශපාලන අංශය මාර්ගයෙන් ලබා ගත්තෙමු. අධ්‍යාපන කණ්ඩායම 'සුදන්දිර පරවෛහල්' සහ දේශපාලන විද්‍යා අංශය කාන්තා කණ්ඩායම්වල පරිපාලන කටයුතු සමඟ ප්‍රාදේශීය ප්‍රචාරක කටයුතුවලද මම මහත් උනන්දුවෙන් නිමග්න වීමි.

නැගෙනහිර පළාතේ සටන්කාමියෝ 'ජය සිකුරු' හමුදා මෙහෙයුමට එරෙහි ප්‍රහාර සඳහා ගන කැලෑ මැදින් මහත් දුෂ්කරතා විඳගෙන හමුදා සමඟ ගැටෙමින් මාස ගණනාවක් තිස්සේ පා ගමනින් ඇවිත් වන්නියට ළඟා වෙමින් උන්හ. මේ අතර වන්නියේ සිට ද සටන්කාමී බළඇණි සමහර අවශ්‍යතා සඳහා නැගෙනහිරට ගමන් කරන්නට විය. දේශපාලන අංශයෙහි කාන්තා සටන්කාමීන් සහ වෛද්‍ය අංශයෙහි සටන්කාමීන් ඇතුළත් කණ්ඩායමක් තරුණ සේනාධිපතිවරයෙකු වූ කීරන්ගේ නායකත්වයෙන් මඩකළපුවට යෑමට සූදානම් විය. 1998 වසරෙහි අවසානයෙහි හෝ නැතහොත් 1999 වසරේ ආරම්භයේ හෝ මෙය සිදුවූවා විය හැකිය. මෙම බලඇණිය පිටත්ව ගොස් මාසයකට පසුව ඉතාමත් දරුණු ආරංචියක් ලැබිණි. එම කණ්ඩායමට අතරමැද දී කොලරා රෝගය ඇතිවී මහත් විපතකට මුහුණ දීමට සිදුව ඇති බවත්, එම බලඇණියෙන් බහුතරය මෙම කොලරා රෝගය නිසා මරණයට ලක්ව ඇති බවත් ඉතිරිව සිටින පිරිස ඉතා දරුණු පීඩාවකට පත්ව සිටින බවත්, ඔවුන්ව ආරක්ෂා කර ගැනීමේ උත්සාහයන් සිදුකරමින් පවතින බවත් එම ආරංචිය විය.

මෙම ආරංචිය ලැබී දින දෙක තුනකට පමණ පසුව වහාම මුලතිව් මුහුදු වෙරළට පැමිණෙන ලෙස අපට කැඳවීමක් ලැබිණ. මම සටන්කාමී සහෝදරියන් සමඟ එම ස්ථානයට ගිය අවස්ථාවේ සේනාධිපති කීරන්ගේ නායකත්වයෙන් මඩකලපුවට ගිය බළඇණියේ මියගිය අයගේ මළ සිරුරු සහ මරුවා සමඟ පොර බදමින් සිටි අයව මුහුදු කොටින් රැගෙන එමින් තිබුණි. මළ සිරුරු ඒ වන විටත් සූදානම් කර තිබූ වාහනවලින් රැගෙන ගියේය. මා හොඳින් දන්නා සටන්කාමී සහෝදරියක් වූ සරෝජනී කොලරා රෝගයෙන් මිය ගිය බවත්, ඇයව කැළෑ මාර්ගයේම තැනෙක වළලා දැමූ බවත් මට ආරංචි විය. තවත් එක් සටන්කාමී සහෝදරියක් වූ සුධර්ගනී දැඩි ලෙස පීඩාවට පත්ව මළ සිරුරක් සේ දෑස් පියාගෙන උන්නාය. අනෙක් අයගේ

**38 වන පිටට**



සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com